[Limited Sharing]

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව | உள்நாட்டு தொழிற்பாடுகள் திணைக்களம் | Domestic Operations Department

චක්‍රලේඛ අංක : 2025 අංක 01

2025 අප්‍රේල් 01

ප්‍රධාන විධායක නිලධාරීන්, බලපත්‍රලාභී වාණිජ බැංකු
ප්‍රධාන විධායක නිලධාරී, ජාතික ඉතිරිකිරීමේ බැංකුව
ප්‍රධාන විධායක නිලධාරීන්, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්
ප්‍රධාන විධායක නිලධාරීන්, බලයලත් මුදල් තැරැව්කරුවන්
අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව පිහිටුවීම**

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන දේශීය විදේශ විනිමය වෙළඳපොළ අංශය ඒකාබද්ධ කිරීමෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව 2025 අප්‍රේල් මස 02 දින සිට බලපැවැත්වෙන පරිදි පිහිටුවන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව පිහිටුවීමත් සමග, මින් පෙර දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සහ ගනුදෙනුවලට අදාළව ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද සියලුම රෙගුලාසි, චක්‍රලේඛ සහ මෙහෙයුම් උපදෙස්, ඒවායෙහි අන්තර්ගය වෙනස් කිරීමක් අවශ්‍ය වුවහොත් හැර අඛණ්ඩව බලාත්මක වනු ඇත.

වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ නව විද්‍යුත් තැපැල් ලිපින, පිළිවෙළින්, dmod@cbsl.lk (අධ්‍යක්ෂ, වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව) සහ mod@cbsl.lk (වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය විද්‍යුත් තැපැල් ලිපිනය) වනු ඇත. වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව සඳහා වන දුරකථන අංක සහ වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව යටතේ දේශීය විදේශ විනිමය වෙළඳපොළ අංශයේ විද්‍යුත් තැපැල් ලිපිනය (dfx@cbsl.lk) නොවෙනස්ව පවතිනු ඇත.

අත්සන් කළේ,
ආර්.ඒ අනිල් පෙරේරා
අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු

7 වන මහල, 2 වන කුළුණ
අංක 30, ජනාධිපති මාවත
තැ.පෙ. 590, කොළඹ 01, ශ්‍රී ලංකාව

தளம் 7, கோபுரம் 2
இல. 30, சனாதிபதி மாவத்தை
த.பெ 590, கொழும்பு 01, இலங்கை

Level 7, Tower 2
No. 30, Janadhipathi Mawata
P.O. Box 590, Colombo 01, Sri Lanka

+94 112 477036 | +94 112 346287 | ddod@cbsl.lk | www.cbsl.gov.lk